**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

--------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික කෞතුකාගර දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.3 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයෙන් අනතුරුව කාර්යාල උපකරණ පරිගණක විදුලි උපකරණ හා ලිබඩු ඇතුළු විවිධ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩ 2019 වර්ෂයේදී වෙන්දේසි කර විකිණීම් කර තිබුණද අපහරණයන් යටතේ එම වටිනාකම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | වෙන්දේසියේදී ඉවත් කළ ඉන්වෙන්ට්‍රිගත භාණ්ඩවල වටිනාකම ගිණුම් වලින් ඉවත් කළ යුතුය. | අපහරණය කරන ලද ද්‍රව්‍ය වල පිරිවැය හඳුනාගෙන එම වටිනාකම් 2020 සැප්තැම්බර් 30 දින වන විට ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,074,934 ක ණය ශේෂවල වර්ෂ 14 සිට වර්ෂ 25 දක්වා පැරණි ණය ශේෂ පැවති අතර අයකර ගැනීමට දෙපාර්තමේන්තුව මෙතෙක් අපොහොසත් වී තිබුණි. | සේවය හැර ගිය සේවකයින්ගේ ණය ශේෂ අයකර ගැනීමට අප්‍රමාදව ක්‍රියා කළ යුතුය. | සේවය අතහැරගොස් ඇති නිලධාරීන්ගේ ලැබිමට ඇති ණය ශේෂ පිළිබඳ විස්තර හා ඒ සඳහා ගත් පියවර සඳහන් කර ඇති බව කාරුණිකව දන්වමි . |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටය පරිදි ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | 2020.09.30 දින වන විට යාවත්කාලීන කර වාර්ථා කරමි. |
| (ආ) **පරිගණක මෘදුකාංග ලේඛනය** | | |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | 2020.09.30 දින වන විට යාවත්කාලීන කර වාර්ථා කරමි. |
| (ඇ) **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගේ හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | ඇප ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | සටහන් කර ගතිමි. |
| (ඈ) **විදුලි උපකරණ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මු.රෙ.454(2) ප්‍රකාරව විදුලි උපකරණ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. | ලේඛනයක් පවත්වාගෙන යන අතර, 2020.09.30 දින වන විට එය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

**(ඉ) ඉන්ධන හා ලිහිසි තෙල් තොග ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647 (ඇ) ප්‍රකාරව ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉන්ධන හා ලිහිසි තෙල් තොග පොත් මු.රෙ. 1647 (ඇ) ප්‍රකාරව පවත්වා ගෙන යා යුතුය. | ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී. |

**(ඊ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය මු.රෙ.1647 (ඉ) ප්‍රකාරව පවත්වා ගෙන යා යුතුය. | ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී. |

**(උ) ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ ලේකම්වරයා විසින් හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික කමිටුවේ පැමිණීමේ ලේඛන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 පරිදි පවත්වා ගෙන යා යුතුය. | පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනිමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව | අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීතාවය සමාලෝචනය කර විගණකාධිපතිවරයාට වාර්තා කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි .

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ට වැඩි කල් ඉකුත් වූ වටිනාකම රු.9,035 ක් වූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. | මේ වන විට මුදල් රෙගුලාසි 396 (ඇ) iii අනුව කටයුතු කර ඇත . |
| (ආ) | චෙක්පතක වලංගුකාලය දීර්ඝ කිරීමේදී මුදල් රෙගුලාසි 391 නියමයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් මාසයේ ලියන ලද රු.5,194,149 ක් වූ චෙක්පත් 02 ක් 2019 ඔක්තෝම්බර් වනවිටත් ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | චෙක්පත්වල වලංගු කාලය දීර්ඝ කිරීමේදී මුදල් රෙගුලාසි 391 ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. | මුදල් රෙගුලාසි 391 නියමයන්ට අනුව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී ආරම්භ කර තිබූ ගිනි නිවීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.19,867,214 ක් විය. මෙම පද්ධතියේ සවිකරන ලද උපාංගවල පිරිවිතරයන් නිවැරදි බවට සහතිකයක් ගිනිනිවන හමුදාව මගින් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත් මෙම පද්ධතිය නිවැරදි ලෙස ක්‍රියාත්මක වන්නේදැයි අදාළ පෞද්ගලික සමාගම මගින් පරීක්ෂා කර වාර්තාවක් ලබා දී නොතිබුණි. | ගිනි නිවන පද්ධතිය නිවැරදිව ක්‍රියාකරන බවට වාර්තාවක් අදාළ පෞද්ගලික සමාගමෙන් ලබා ගත යුතුය. | විගණන නිරීක්ෂණ හා එකඟත්වය පලකර ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ගිනි නිවන පද්ධතියේ කටයුතු අවසන් වුවද එය පරීක්ෂා කර බලා නිවැරදි බව තහවුරු කර ගැනීමට ජල ටැංකි ව්‍යාපෘතිය නිමකර භාරදීම අවශ්‍ය වන බව අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ 2018 මැයි 28 දින අංක DNM /1/3/1/20 II ලිපිය මගින් දන්වා තිබුණි. කෙසේ වෙතත් මෙම ජල ටැංකිය ඉදි කිරීමේ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිපල ලබාගැනීම සඳහා ජල ටැංකිය ඉදිකිරීමේ කටයුතු කඩිනමින් නිමකළ යුතුය. | විගණන නිරීක්ෂණ හා එකඟත්වය පලකර ඇත. |

**3.3 අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 139(4) අනුව සෑම ගෙවීමකටම අදාල වවුචරයකටම විධිමත් කුවිතාන්සියක් ලබා ගත යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනැති රු.18,104,879 වටිනා ගෙවීම්වලට අදාල චෙක්පත් 11 ක් 2019 මැයි 27 දින දක්වා නිකුත් නොකර ගණකාධිකාරී වෙත රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 139 (4) අනුව විධිමත් කුවිතාන්සියක් ලබාගෙන චෙක්පත් අප්‍රමාදව නිකුත් කළ යුතුය. | කුවිතාන්සි ලබාගෙන චෙක්පත් නියමිත ආදායකයාට භාර දී ඇත. |
| (ආ) | 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 05 ක හා 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 01 ක ඉතිරි වූ මුදල් එකතුව රු.2,201,775 ක් දෙපාර්තමේන්තු ආපනශාලාව නවීකරණය කිරීමේ කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් හිලව් කර ගෙන තිබුණි. | ව්‍යාපෘති නිමකිරීමෙන් පසු ඉතිරි වන මුදල් ගෙන්වා ගත යුතු අතර ඒවා ඊළඟ වර්ෂයේ ව්‍යාපෘති වියදම් වලින් හිලව් නොකළ යුතුය. | එවකට නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා විසින් 2019/01/09 දින සිදු කරන ලද නිරීක්ෂණ චාරිකාවේදි මෙම ආපනශාලාව දැඩි පරීක්ෂාවට ලක්කරන ලද අතර, එහිදී මෙම ගොඩනැගිල්ල කඩිනමින් අලුත්වැඩියා කළ යුතු බව දන්වන ලදී. ඒ අනුව මෙම කාර්යය කඩිනමින් ඉටුකරවා ගැනීම සඳහා, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු ලබා ගන්නා ලදී.<br>දෙපාර්තමේන්තුව විසින් පවරා ඉටුකර ඇති කොන්ත්‍රාත්වලින් රු.2,201,775 ක මුදලක් ඉතිරිව ඇති බවට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දන්වන ලද අතර, ඒ අනුව මුළු ඇස්තමේන්තුවෙන් එම මුදල අඩුකර 2019 වසරේ ප්‍රතිපාදන වලින් ඉතිරි රු.3,409,671 ක මුදල ගෙවා මෙම කාර්යය නිම කරන ලදී. |

**3.4 වෙනත් නිරීක්ෂණ**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ප්‍රධාන කැමරා නිරීක්ෂණ මැදිරියේ දිවා රාත්‍රී නිරීක්ෂණ කටයුතු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන බව විගණනයට 2018 ඔක්තෝබර් 25 දින දන්වා සිටි මුත් 2020 ජූලි වනවිටත් එම කටයුතු ඉටු කර නොතිබුණි. | ප්‍රධාන නිරීක්ෂණ මැදිරිය දිවා රාත්‍රී නිරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අනුමත කර ගත් ආරක්ෂක කැමරා නිරීක්ෂක තනතුරු 3 හි පුරප්පාඩු පිරවිය යුතුය. | විගණන නිරීක්ෂණ හා එකඟත්වය පලකර ඇත. |

**4. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ. | | |
| (i) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගත යුතුය. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |
| (ii) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ බවට සාක්ෂි නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ හා එකග වෙමි. |